*සැ. යු.* - 2013.06.21 දින පළ වූ අංක 1,816 දරන *ගැසට් පත්‍රයේ* I : III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,817 - 2013 ජුනි මස 28 වැනි සිකුරාදා - 2013.06.28**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 984 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 987 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 990 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 994 |
| විවිධ දැන්වීම් ... ... ... | — |

*සැ. යු.*- (i) කේ. ඩී. එම්. චන්ද්‍රා බණ්ඩාර ප්‍රජා සත්කාර පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත, 2013 මැයි මස 03 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී ;

(ii) අකුරණ ජාමිආ රහ්මානියා අරාබි විදුහල (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත, 2013 මැයි මස 10 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී ;

(iii) මහනුවර ධර්මරාජ විද්‍යාලයීය ආදිශිෂ්‍ය සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත, 2013 මැයි මස 10 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 ජූලි මස 19 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 ජූලි මස 05 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

පී. එච්. එල්. වී. ද සිල්වා,
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*.

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**කෑගල්ල මහාධිකරණය**

අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්ගේ ආ12/වාහන වෙන්දේසි (3) 2003 හා 2003.12.10 දිනැති චක්‍ර ලේඛය අනුව වරකාපොල දිසා මහෙස්ත්‍රාත් අධිකරණයේ රාජසන්තක කරන ලද පහත විස්තර සඳහන් වාහන විකිණීම සඳහා සීල් තබන ටෙන්ඩර් මිළ ගණන් 2013.07.01 වැනි දින පෙ. ව. 10.00 සිට 2013.07.25 වැනිදින පෙ. ව. 10.00 දක්වා කෑගල්ල මහාධිකරණයේ දී භාරගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර මහාධිකරණ විනිසුරු, මහාධිකරණය, කෑගල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාරදිය යුතුයි.

ලියාපදිංචි තැපෑලෙන් ටෙන්ඩර් පත්‍රය එවීමේ දී ලිපිකවරයේ වම් පස ඉහළ කොළවරේ "ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කළ යුතු ය.

අදාල වාහන පිළිබඳ විස්තරය

| *නඩු අංකය* | *වාහනය* | *ටෙන්ඩර් ඇප තැන්පත්* | |
|---|---|---|---|
| | | *ආපසු ගෙවන* | *ආපසු නොගෙවන* |
| | | *රු. ශ.* | *රු. ශ.* |
| 53223 | 48-3552<br>ඉසුසු එල්ෆ් මෝටර් ලොරිය | 7,500 0 | 100 0 |
| බී 481/2009 | 253-2136<br>ටොයෝටා හයි එස් වෑන් රථය | 5,000 0 | 100 0 |

1. ටෙන්ඩර් භාරගැනීම අවසන් වූ වහාම ටෙන්ඩර් විවෘත කර අනුමැතිය සඳහා මහාධිකරණයේ ටෙන්ඩර් මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබේ.

2. ටෙන්ඩර් මණ්ඩලයේ අනුමැතියෙන් පසු 2013.07.25 වැනි දින පෙ. ව. 11.30 ට වැඩිම ඉල්ලුම්කරුට එම වාහනය විකුණනු ලබන බැවින් ටෙන්ඩර්කරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකු අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා පිළිගත් හැඳුනුම්පතක් ද රැගෙන නියමිත වේලාවට පැමිණ සිටිය යුතු ය.

3. කිසියම් ටෙන්ඩර්කරුවෙකු විසින් විධිමත් පරිදි ටෙන්ඩර් පත ඉදිරිපත් කර යම් හෙයකින් ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකු පැමිණ නොසිටියහොත් එම ටෙන්ඩරය අවලංගු වනු ඇත.

4. ඉහත සඳහන් පරිදි එක් එක් වාහනය සඳහා ඉල්ලුම් පත්‍ර ගාස්තු වශයෙන් ආපසු නොගෙවන රුපියල් 100 ක ටෙන්ඩර් ගාස්තුවක් සහ ඉහත සඳහන් පරිදි ආපසු ගෙවන ඇප තැන්පත් මුදලක් කෑගල්ල මහාධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත ගෙවා ආකෘති පත්‍ර ලබා ගත යුතු ය.

මේනකා විජේසුන්දර,
මහාධිකරණ විනිසුරු,
සබරගමුව පළාත්බද මහාධිකරණය,
කෑගල්ල.

2013ක් වූ ජුනි මස 05 වැනි දින,
කෑගල්ල මහාධිකරණයේ දී ය.

06-780

---

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීමයි

**ශ්‍රී ලංකා දුම්රිය සේවයට සිමෙන්ති බෑග් 13,800ක්, ඇසබැස්ටෝස් සෙවිලි තහඩු 11,800ක් සහ ඇස්බැස්ටෝස් පැතලි තහඩු 1100ක් සැපයීම**

**SRS/F 7026**

කොළඹ 10, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන) හි, සභාපති විසින්, සිමෙන්ති බෑග් 13,800 ක් ඇස්බැස්ටෝස් වහල සෙවිලි තහඩු 11,800ක් සහ ඇස්බැස්ටෝස් පැතලි තහඩු 1,100ක් සැපයීම සඳහා, මුද්‍රා තබන ලද ලංසු, 2013.07.09 වැනි දින පැය 02.00 දක්වා භාරගනු ලැබේ.

| *අයිතමය* | *විස්තරය* | *ප්‍රමාණය* |
|---|---|---|
| 01. | (එකක් කි. ග්‍රෑ. 50) සිමෙන්ති බෑග් | 13,800 |
| 02. | ඇස්බැස්ටෝස් සෙවිලි තහඩු | |
| *(අ)* | දිගින් 6' 00" | 3,000 |
| *(ආ)* | දිගින් 8 '00" | 4,500 |
| *(ඇ)* | දිගින් 10' 00" | 4,300 |
| *(ඈ)* | ඇස්බැස්ටෝස් පැතලි තහඩු (4' 00" x 4' 00") | 1,100 |

02. ලංසු, ආපසු ගෙවනු නොලබන රු. 3,000 ක් පමණක් වන ලිපිලේඛන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව 2013.07.08 වැනි දින ප. ව. 3.00 දක්වා, කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩාවේ, අධිකාරි කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘතිපත්‍ර මත පමණක් ඉදිරිපත් කළ යුතු ය.

03. ලංසු භාරගැනීම 2013.07.09 වැනි දින ප. ව. 2.00 ට අවසන් වේ.

04. ලංසු, එම ලංසු භාරගන්නා වේලාව අවසන් වූ වහාම කොළඹ 10, ඕල්කට් මාවතේ, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, දුම්රිය මූලස්ථාන කාර්යාලයේ දී විවෘත කරනු ලබන අතර, එකී අවස්ථාවට, ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට පැමිණ සිටිය හැකි ය.

05. මුද්‍රා තබන ලද ලංසු පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ, ලියාපදිංචි කළ තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනැවිත් භාරදීම හෝ කළ යුතු ය.

සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන), ශ්‍රී ලංකා දුම්රිය සේවය, දුම්රිය මූලස්ථානය, ඕල්කට් මාවත, කොළඹ 10.

06. ලංසු ලිපිලේඛන, කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී නොමිලේ (ගාස්තු ගෙවීමෙන් තොරව) පරීක්ෂා කර බැලිය හැකිවන අතර, වැඩිදුර විස්තර සඳහා දුම්රිය ගබඩා අධිකාරි වෙතින්,

දුරකථන අංක : 94 (11) 2438078 හෝ 2436818
ෆැක්ස් අංක : 94 (11) 2432044 විමසනු මැනවි.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන)
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F.7026

06-818

---

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීමයි

**ගැල්වනයිස් ඉලාස්ටික් රේල් ක්ලිප් 200,000ක් සැපයීම**

ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ස්ථිර මාර්ගයේ පීලි යළි ඇතිරීම හා සිල්පර කොටං ඇතිරීම සඳහා ගැල්වනයිස් ඉලාස්ටික් රේල් ක්ලිප් 200,000ක් සැපයීම සඳහා නිෂ්පාදකයින්/සැපයුම්කරුවන් වෙතින්, ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඕල්කොට් මාවතේ, දුම්රිය මූලස්ථානය, ශ්‍රී ලංකා දුම්රිය සේවය, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදක කමිටුවේ (ප්‍රධාන), සභාපති විසින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ. ලංසුකරුවන් තමන්ගේ ලංසු සෘජුව හෝ ඇටෝර්නි බලයෙන් බලවත් කරන ලද ශ්‍රී ලංකාවේ ලියාපදිංචි බලයලත් නියෝජිතයින් මාර්ගයෙන් හෝ ඉදිරිපත් කළ හැකි ය.

02. ශ්‍රී ලංකා රුපියල් 3,000 ක් හෝ පහසුවෙන් පරිවර්තනය කළ හැකි සමාන වටිනාකමින් යුත් මුදලක් ආපසු ගෙවනු නොලබන ලිපිලේඛන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව 2013.07.25 වැනි දින (ශ්‍රී ලංකාවේ වේලාවෙන්) ප. ව. 3.00 දක්වා ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඕල්කොට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි තැනගේ කාර්යාලයෙන් හෝ විදේශීය ශ්‍රී ලංකා දූත මණ්ඩලවලින් ලබාගත හැකි ආකෘති පත්වල පමණක් ලංසු ඉදිරිපත් කළ යුතුයි.

03. ISO 9001: 2000/ISO 9002:1994 / BSEN ISO 9001 : 2000 / BS EN ISO 9002 : 1994 හෝ ගැණුම්කරු විසින් පිළිගත හැකි ජාත්‍යන්තර තත්ව කළමනාකරණ පද්ධති තත්ව සහතිකයක් ලද සමාගම් පමණක් ගැල්වනයිස් ඉලාස්ටික් රේල් ක්ලිප් නිෂ්පාදනය කළ යුතුයි.

04. 2013.07.26 වැනි දින (ශ්‍රී ලංකා වේලාවෙන්) ප. ව. 2.00 ට ලංසු භාරගැනීම අවසන් කෙරේ. මුද්‍රා තබන ලද ලංසු,

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය, දුම්රිය මූලස්ථානය,
ඕල්කොට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.

යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනැවිත් භාරදිය යුතුයි.

05. ලංසු භාරගැනීම අවසන් වූ වහාම ඉහත 4 වන ඡේදයේ සඳහන් ලිපිනයේ දී, ලංසු විවෘත කරනු ලැබේ. එම අවස්ථාවට ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට සහභාගි විය හැකි ය.

06. ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඕල්කොට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී ගෙවීමකින් තොරව ලංසු ලිපිලේඛන පරීක්ෂාකර බැලිය හැකි අතර, වැඩි විස්තර සඳහා පහත සඳහන් අය අමතන්න :-

දුම්රිය ගබඩා අධිකාරී,
දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1347, ඕල්කොට් මාවත,
කොළඹ 10, ශ්‍රී ලංකාව.
දුරකථන අංක : 94 (11) 2438078 හෝ 94 (11) 2436818
ෆැක්ස් අංකය : 94 (11) 2432044.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F.7052.

06-817

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීම

**ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, ස්ථාවර භෝජනාගාර බදුදීම සඳහා ප්‍රසම්පාදන කමිටු ලංසු කැඳවීම**

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් පහත භෝජනාගාර වසර දෙකක කාලයකට ආහාරපාන අලෙවි කිරීමේ සේවාවන් පවත්වාගෙන යාම සඳහා දුරකථන නාමාවලියේ දේදුනු වර්ණ පිටුවල සඳහන් පිළිගත් භෝජනාගාර හා හෝටල් හිමියන්ගෙන් පමණක් මුද්‍රා තබන ලද ප්‍රසම්පාදන ලංසු කැඳවනු ලැබේ.

02. පහත භෝජනාගාර සඳහා අයදුම්පත් කැඳවනු ලබන අතර ඊට අදාළ ලංසු ඉදිරිපත් කිරීමට කොළඹ 10 ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ප්‍රධාන ගණකාධිකාරී වෙත ආපසු නොගෙවන ප්‍රසම්පාදන ලංසු පෝර්ම ගාස්තුව වන රු. 2,500 ක් ගෙවා ලබාගත් කුවිතාන්සිය දුම්රිය ගබඩා අධිකාරී වෙත ඉදිරිපත් කර ලබාගන්නා ලද පෝරමයේ පමණක් මෙම අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය. ලංසු බැඳුම්කරයක් ලෙස පහත පරිදි ගාස්තු ප්‍රධාන දුම්රිය ගණකාධිකාරී වෙත ගෙවා ලබාගන්නා ලදුපත ලංසු අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතු ය.

| *අනු. අංකය* | *ස්ථාවර භෝජනාගාරය* | *ප්‍රසම්පාදන ලංසු පෝර්ම ගාස්තුව රු. ශ.* | *ආපසු ගෙවන ලංසු බැඳුම්කරය රු. ශ.* |
|---|---|---|---|
| (1) | ගම්පහ දුම්රිය ස්ථාන භෝජනාගාරය | 2,500 0 | 25,000 0 |
| (2) | බණ්ඩාරවෙල දුම්රිය ස්ථාන භෝජනාගාරය | 2,500 0 | 10,000 0 |
| (3) | හැටන් දුම්රිය ස්ථාන භෝජනාගාරය | 2,500 0 | 10,000 0 |
| (4) | නානුඔය දුම්රිය ස්ථාන භෝජනාගාරය | 2,500 0 | 20,000 0 |
| (5) | මාතර දුම්රිය ස්ථාන භෝජනාගාරය | 2,500 0 | 20,000 0 |
| (6) | අනුරාධපුර 4/5 වේදිකා භෝජනාගාරය | 2,500 0 | 10,000 0 |
| (7) | රඹුක්කන දුම්රිය ස්ථාන භෝජනාගාරය | 2,500 0 | 10,000 0 |
| (8) | දකුණු කළුතර දුම්රිය ස්ථාන භෝජනාගාරය | 2,500 0 | 10,000 0 |
| (9) | මහනුවර දුම්රිය ස්ථාන වේදිකා භෝජනාගාරය | 2,500 0 | 50,000 0 |
| (10) | මහනුවර දුම්රිය ස්ථාන උඩුමහල් භෝජනාගාරය | 2,500 0 | 20,000 0 |

03. ඉහත සඳහන් පෝරම සහ ඊට අදාළ ලියවිලි 2013.07.04 වැනි දින ප. ව. 3.00 දක්වා දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයෙන් නිකුත් කරනු ලැබේ.

04. නිසි පරිදි සම්පූර්ණ කර මුද්‍රා තබන ලද අයදුම්පත් 2013.07.05 වැනි දින ප. ව. 2.00 ට පෙර "සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, ශ්‍රී ලංකා දුම්රිය සේවය, දුම්රිය මූලස්ථානය, ඕල්කට් මාවත, කොළඹ 10," යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ දුම්රිය මූලස්ථානයේ ලංසුපත් බහාලීම සඳහා සකසා ඇති විශේෂ පෙට්ටියෙහි බහාලීමට කටයුතු කළ යුතු ය.

05. එදින පස්වරු. 2.00 ට අයදුම්පත් භාරගැනීම අවසන් වූ වහාම එම ස්ථානයේ දී අයදුම්පත් විවෘත කරනු ලබන අතර, එම අවස්ථාවේ දී අයදුම්කරුට හෝ ඔහුගේ බලයලත් එක් නියෝජිතයෙකුට හෝ පෙනී සිටිමට ඉඩදෙනු ලැබේ.

06. ශ්‍රී ලංකා දුම්රිය සේවයේ සියලු සේවකයන්ට හා ඔවුන්ගේ පවුල්වල ආසන්නම සාමාජිකයන්ට අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා හිමිකමක් නැත.

07. අවශ්‍ය වැඩි විස්තර සඳහා ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ගබඩා අධිකාරී කාර්යාලය වෙතින් විමසන්න.
දුරකථන අංක : 011-2438078/011-2436818.

08. ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

බී. ඒ. පී. ආරියරත්න,
දුම්රිය සාමාන්‍යාධිකාරී.

2013 මැයි මස 29 වැනි දින,
දුම්රිය මූලස්ථානය,
ඕල්කට් මාවත, කොළඹ 10 දී ය.
එස්ආර්එස්/එෆ්. 7032

06-816

---

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීම

**ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, දුරගමන් දුම්රියවල ජංගම භෝජනාගාර ඒකක, කොළඹ කොටුව දුම්රිය ස්ථානයේ ස්ථාවර භෝජනාගාර ඒකක සහ මරදාන භෝජනාගාරය බදුදීම සඳහා ප්‍රසම්පාදන කමිටු ලංසු කැඳවීම**

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් ඉහත භෝජනාගාර වසර දෙකක කාලයකට, ආහාර පාන අලෙවි කිරීමේ සේවාවන් පවත්වාගෙන යාම සඳහා පිළිගත් හා සංචාරක මණ්ඩල අනුමැතිය සහිත පිළිගත් භෝජනාගාර හා හෝටල් හිමියන්ගෙන් මුද්‍රා තබන ලද ප්‍රසම්පාදන ලංසු කැඳවනු ලැබේ.

01. දුරගමන් සේවා දුම්රියවල ඇති ජංගම භෝජනාගාර ඒකක හා කොටුව ස්ථාවර භෝජනාගාර

(i) අංක 1045/46 බදුල්ල රාත්‍රී තැපැල් දුම්රිය භෝජන රථය
(ii) අංක 1015/16 උඩරට මැණිකේ භෝජනරථය
(iii) අංක 1005/06 පොඩිමැණිකේ භෝජනරථය
(iv) අංක 6079/80 මීනගයා භෝජනරථය
(v) අංක 4001/02 යාල්දේවි භෝජනරථය
(vi) අංක 4089/90 රාත්‍රී තැපැල් කොටුව - වවුනියාව භෝජනරථය
(vii) අංක 1009/10 නගරාන්තර කොටුව මහනුවර භෝජනරථය
(viii) අංක 1029/30 නගරාන්තර කොටුව - මහනුවර භෝජනරථය
(ix) අංක 6011/12 උදයදේවි භෝජනරථය
(x) අංක 4003/04 කොටුව - වවුනියා භෝජනරථය
(xi) අංක 7083/84 කොටුව ත්‍රිකුණාමලය භෝජනරථය
(xii) අංක 8056/57 මරදාන - මාතර ගාලුකුමාරි භෝජනරථය
(xiii) අංක 8058/59 මරදාන - මාතර රුහුණුකුමාරි භෝජනරථය
(xiv) අංක 1039/40 මාතර - මහනුවර භෝජනරථය

*කොළඹ කොටුව දුම්රිය ස්ථානයේ ස්ථාවර භෝජනාගාර*

(i) කොළඹ කොටුව දුම්රිය ස්ථාන පරිශ්‍රයේ ඇති භෝජනාගාර මුළුතැන්ගෙය හා බේකරිය
(ii) කොළඹ කොටුව දුම්රිය ස්ථාන පරිශ්‍රයේ ඇති භෝජනාගාර ගබඩාව
(iii) කොළඹ කොටුව දුම්රිය ස්ථානයේ 1 වැනි සහ 2 වැනි පංති භෝජනාගාරය
(iv) කොළඹ කොටුව දුම්රිය ස්ථානයේ 3 වැනි පංතියේ භෝජනාගාරය
(v) කොළඹ කොටුව දුම්රිය ස්ථානයේ 5/6 වේදිකා භෝජනාගාරය

2. *මරදාන දුම්රිය ස්ථානයේ භෝජනාගාරය*

02. ඉහත 1 හා 2 හි සඳහන් භෝජනාගාර සඳහා ලංසු ඉදිරිපත් කිරීමට, කොළඹ 10, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ප්‍රධාන ගණකාධිකාරී වෙත ආපසු නොගෙවනු ලබන ලංසු පෝරම ගාස්තුව ලෙස රු. 2,500 ක් වෙන වෙනම ගෙවා ලබාගත් කුවිතාන්සිය දුම්රිය ගබඩා අධිකාරී වෙත ඉදිරිපත් කර ලබා ගන්නා ලද පෝරමයේ පමණක් මෙම අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය. ලංසු බැඳුම්කරයක් ලෙස ඉහත 01 හි සඳහන් භෝජනාගාර සඳහා දෙපාර්තමේන්තුව ඉදිරිපත් කර ඇති අවම බදු මුදලින් 1% ක් වන රු. 1,77,600.00ක් ද අංක 2 හි සඳහන් මරදාන දුම්රිය ස්ථාන භෝජනාගාරය සඳහා රු. 75,000ක් ද ප්‍රධාන දුම්රිය ගණකාධිකාරී වෙත ගෙවා ලබා ගන්නා ලදුපත ප්‍රසම්පාදන අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතු ය.

03. ඉහත සඳහන් පෝරම සහ ඊට අදාල ලියවිලි 2013.07.04 වැනි දින ප. ව. 3.00 දක්වා දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයෙන් නිකුත් කරනු ලැබේ.

04. නිසිපරිදි සම්පූර්ණ කර මුද්‍රා තබන ලද අයදුම්පත් 2013.07.05 වැනි දින ප. ව. 2.00 ට පෙර "සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, ශ්‍රී ලංකා දුම්රිය සේවය, දුම්රිය මූලස්ථානය ඕල්කට් මාවත, කොළඹ 10" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ දුම්රිය මූලස්ථානයේ ලංසුපත් බහාලීම සඳහා සකසා ඇති විශේෂ පෙට්ටියෙහි බහාලීමට කටයුතු කළ යුතු ය.

05. එදින පස්වරු 2.00 ට අයදුම්පත් භාරගැනීම අවසන් වූ වහාම එම ස්ථානයේ දී අයදුම්පත් විවෘත කරනු ලබන අතර, එම අවස්ථාවේ දී අයදුම්කරුට හෝ ඔහුගේ බලයලත් එක් නියෝජිතයකුට හෝ පෙනී සිටීමට ඉඩදෙනු ලැබේ.

06. ශ්‍රී ලංකා දුම්රිය සේවයේ සියලු සේවකයන්ට හා ඔවුන්ගේ පවුල්වල ආසන්නම සාමාජිකයන්ට අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා හිමිකමක් නැත.

07. අවශ්‍ය වැඩි විස්තර සඳහා ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ගබඩා අධිකාරී කාර්යාලය වෙතින් විමසන්න. දුරකථන අංක 011- 2438078/011-2436818.

08. ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

බී. ඒ. පී. ආරියරත්න,
දුම්රිය සාමාන්‍යාධිකාරී.

2013 මැයි මස 29 වැනි දින,
දුම්රිය මූලස්ථානය,
ඕල්කට් මාවත, කොළඹ 10 දී ය,
එස්ආර්එස්/එෆ්.7032/I වෙළුම.

06-819

# බඩු බාහිරාදිය විකිණීම්

## දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - කැබිතිගොල්ලෑව

කැබිතිගොල්ලෑව දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරන ලද, මෙතෙක් හිමිකම් නොපාන ලද සහ උසාවි ගොඩනැගිලි අලුත්වැඩියා කිරීමේ දී සහ නව ගොඩනැගිලි ඉදි කිරීමේ දී ඉවත් කරන ලද ද්‍රව්‍ය ආදී පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ වර්ෂ 2013 ජූලි මස 20 වැනි දින පෙ. ව. 9.30 සිට මෙම අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. වෙන්දේසිය සඳහා ඉදිරිපත් කිරීමට නියමිත උපලේඛනයේ සඳහන් භාණ්ඩ එදින පෙ. ව. 9.00 සිට පෙ. ව. 9.15 දක්වා මෙම අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබාගෙන පරීක්ෂා කළ හැකි ය.

03. මෙම උපලේඛනයේ සඳහන් වන භාණ්ඩයක් පිළිබඳ අයිතිවාසිකම් කියන්නකු වේ නම්, එදින පෙ. ව. 9.00 ට පෙර ස්වකීය හිමිකම් අධිකරණය වෙත ඉදිරිපත් කොට අදාළ හිමිකම පිළිබඳ අයිතිය සනාථ කළ යුතු ය.

04. වෙන්දේසියෙන් මිළ දී ගනු ලබන භාණ්ඩ සඳහා එම අවස්ථාවේ දී ම මුදල් ගෙවිය යුතු අතර, සියලුම ගෙවීම් මුදල් වලින් පමණක් කළ යුතු ය. මේ සඳහා චෙක්පත් හෝ මුදල් ඇණවුම් හෝ භාරගනු නොලැබේ.

05. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවන්හි දී සහ වෙනත් හේතූන් මත එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අභිමතය අධිකරණය සතුව පවතී.

06. වෙන්දේසියෙන් භාණ්ඩ මිළ දී ගන්නා තැනැත්තන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

07. මිල දී ගනු ලැබූ සියලුම භාණ්ඩ එදින ප. ව. 16.00 ට පෙරාතුව අධිකරණ භූමියෙන් ඉවත් කරගත යුතු ය.

ගයාන් මීගහගේ,
දිසා විනිසුරු හා මහෙස්ත්‍රාත්,
කැබිතිගොල්ලෑව.

2013 ජූනි මස 06 වැනි දින,
කැබිතිගොල්ලෑව දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**වෙන්දේසියේ විකිණීම සඳහා ඉදිරිපත් කරන භාණ්ඩ පිළිබඳ උපලේඛනය**

01. මිට දිග කැති

| අනු. අංකය | නඩු අංකය | ප්‍රමාණය |
|---|---|---|
| 01. | 69653 | 01 |
| 02. | 66565 | 01 |
| 03. | 69042 | 01 |
| 04. | 69651 | 01 |
| 05. | 69652 | 01 |
| 06. | 70136 | 01 |
| 07. | 70867 | 01 |
| 08. | 70870 | 03 |
| 09. | 70871 | 01 |
| 10. | 70873 | 01 |
| 11. | 70875 | 01 |
| 12. | 70877 | 01 |
| 13. | 70878 | 01 |
| 14. | 71455 | 01 |
| 15. | 71456 | 01 |
| 16. | 71457 | 01 |
| 17. | 72603 | 01 |
| 18. | 72610 | 02 |
| 19. | 73201 | 01 |
| 20. | 73205 | 01 |
| 21. | 74300 | 01 |
| 22. | 74342 | 01 |
| 23. | 74344 | 01 |
| 24. | 73346 | 01 |
| 25. | 73420 | 01 |
| 26. | 73421 | 01 |
| 27. | 73422 | 01 |
| 28. | 73423 | 01 |
| 29. | 73488 | 01 |
| 30. | 73889 | 01 |
| 31. | 73897 | 01 |
| 32. | 74464 | 01 |
| 33. | 73105 | 01 |

02. පොරෝ

| අනු. අංකය | නඩු අංකය | ප්‍රමාණය |
|---|---|---|
| 01. | 69653 | 01 |
| 02. | 69656 | 01 |
| 03. | 70049 | 01 |
| 04. | 70050 | 01 |
| 05. | 72611 | 02 |
| 06. | 72612 | 01 |
| 07. | 72823 | 01 |
| 08. | 73887 | 01 |
| 09. | 72879 | 01 |
| 10. | 73890 | 01 |
| 11. | 73895 | 01 |
| 12. | 73198 | 01 |
| 13. | 73200 | 01 |
| 14. | 70870 | 01 |
| 15. | 72610 | 01 |
| 16. | 73105 | 01 |
| 17. | 73258 | 01 |
| 18. | 74364 | 01 |

03. උදළු

| අනු. අංකය | නඩු අංකය | ප්‍රමාණය |
|---|---|---|
| 01. | 73891 | 01 |
| 02. | 73892 | 01 |
| 03. | 74172 | 01 |
| 04. | 74173 | 01 |
| 05. | 74464 | 01 |
| 06. | 74176 | 01 |
| 07. | 72803 | 01 |
| 08. | 72806 | 01 |
| 09. | 72807 | 01 |

04. සවල්

| අනු. අංකය | නඩු අංකය | ප්‍රමාණය |
|---|---|---|
| 01. | 72956 | 05 |
| 02. | 72806 | 02 |
| 03. | 72807 | 01 |
| 04. | 72746 | 01 |
| 05. | 72747 | 02 |

05. කළගෙඩි (ඇළුමිනියම්/ප්ලාස්ටික්)

| අනු. අංකය | නඩු අංකය | ප්‍රමාණය |
|---|---|---|
| 01. | 73121 | 01 (ඇළුමිනියම්) |
| 02. | 65977 | 01 (ඇළුමිනියම්) |
| 03. | 73927 | 01 (ඇළුමිනියම්) |
| 04. | 73136 | 01 (ඇළුමිනියම්) |
| 05. | 73929 | 01 (ප්ලාස්ටික්) |
| 06. | 69136 | 02 (ඇළුමිනියම්) |
| 07. | 62453 | 01 (ඇළුමිනියම්) |
| 08. | 71615 | 01 (ඇළුමිනියම්) |
| 09. | 72363 | 01 (ඇළුමිනියම්) |
| 10. | 72013 | 01 (ඇළුමිනියම්) |
| 11. | 73929 | 01 (ප්ලාස්ටික්) |
| 12. | 73927 | 01 (ඇළුමිනියම්) |
| 13. | 71433 | 01 (ප්ලාස්ටික්) |
| 14. | අංක රහිත | 01 (ප්ලාස්ටික්) |

06. ප්ලාස්ටික් බුලි

| අනු. අංකය | නඩු අංකය | ප්‍රමාණය |
|---|---|---|
| 01. | 73565 | 01 |
| 02. | 72363 | 01 |
| 03. | 74467 | 01 |
| 04. | 74100 | 01 |
| 05. | 73622 | 02 |
| 06. | 73377 | 01 |
| 07. | 73565 | 01 |

07. වෙනත්

| අනු. අංකය | නඩු අංකය | ප්‍රමාණය |
|---|---|---|
| 01. | 73105 | යා/කියත් තල 01<br>රවුම් පීරි 01<br>ත්‍රිකෝණ හැඩ පීරි 01<br>පින්සල් 02 |

| අනු. අංකය | නඩු අංකය | ප්‍රමාණය |
|---|---|---|
| | | වානේ මීටර් 5 ටේප් 01<br>ප්ලග් යතුරු 01<br>ලීටර් 5 ප්ලාස්ටික් බූලි 02 |
| 02. | 73885 | රවුම් පීරි 02<br>ප්ලග් යතුරු 01<br>මැෂින් ටෙස්ට් 01 |
| 03. | 73768 | ලීටර් 5 ප්ලාස්ටික් බූලියක්<br>යතුරු 02<br>බොක්ස් පැනර් 01<br>පීරි 01<br>බුරුසු 01<br>යකඩ ඇක්සල් 01<br>කියතට යොදන දම්වැල් 01<br>ප්ලාස්ටික් පුනීල 01 |
| 04. | 73258 | මුළුමට්ටම් 01<br>කටර් අඬු 02<br>බොක්ස් පැනර් 01<br>ප්ලාස්ටික් කෑම පෙට්ටි 01<br>ප්ලාස්ටික් පිඟන් 03<br>යකඩ ගිර 01<br>ප්ලාස්ටික් බාල්දි 01 |
| 05. | 71047 | අඩි 178.05ක් දිග සුදු සහ කළු මේන් වයර් 01යි<br>අඩි 235ක් දිග සුදු වයරය සහිත අඟල් 6ක් දිග සුදු පැහැති ප්ලග් පොයින්ට් 03ක් සවි කරන ලද වයර් 01යි<br>කොක්ක සහිත බාල්දි 01යි<br>දෙපස කොකු සහිත තාච්චි 01යි<br>කිඹුලා වර්ගයේ ලී මිට සහිත උදළු තල 01යි<br>යකඩ මිටි 01යි<br>අලවංගු 02යි<br>කළගෙඩි 01යි<br>ලී මිට සහිත වෑය 01යි<br>දුම්කබලක් |
| 06. | 72803 | රාත්තල් 14 කුළු ගෙඩි 01යි<br>කුඩා කුළු ගෙඩි 01යි<br>අලවංගු 02යි<br>නයිලෝන් ලණු 01<br>පිකස් 01<br>උල් කටු 02<br>බූලි 02<br>කුඩා මුට්ටි 02<br>ඇළුමිනියම් මුට්ටි 01<br>පිහි 01<br>හිරමන 01 |
| 07. | 61027 | පැනසොනික් වර්ගයේ කැසට් රෙකෝඩර් 01යි<br>700-16 ප්‍රමාණයේ සියට් ටයර් 01යි<br>275-18 ප්‍රමාණයේ යතුරුපැදි ඉදිරිපස රෝද 02යි<br>300X18 ප්‍රමාණයේ යතුරුපැදි පිටුපස රෝද 01යි<br>මීටර් 36 ප්‍රමාණයේ සුදුපාට රෙදිපීස් 01යි |
| 08. | 72407 | රීචාජර්බල් ලාම්පු 01<br>පොකැට් බැලන්ස් 01 |
| 09. | 59965 | මල් බාල්දි 03<br>පාමුල්ලු 02<br>රේක්ක 01 |
| 10. | 73778 | කිලෝග්‍රෑම් 1 තරාදි පඩිය සමග තරාදිය |
| 11. | 71534 | මේස තරාදි 01 |
| 12. | 71223 | රාත්තල් 14 කුළු ගෙඩි 01<br>යකඩ ඉනි 01 |
| 13. | ඒ. ආර්. 756/12 | පොඩි ලැන්තැරුම් 02<br>ලොකු උණු වතුර බෝතල් 01<br>කිලෝ ග්‍රෑම් 10 මේස තරාදි 01යි<br>අඩි 28ක් දිග කොහු ලනු 01<br>අඩි 33ක් දිග නයිලෝන් ලණු 01යි |
| 14. | 74364 | පිහි 03යි<br>පීරි 02යි |
| 15. | 74032 | පිහිය 01<br>තාච්චි 01 |
| 16. | 73778 | තරාදියක්<br>කිලෝග්‍රෑම් 1 පඩි 01 |
| 17. | අංක රහිත | කැලි වලට කපන ලද තඹ බට පොහොර උර 06 |
| 18. | අංක රහිත | හිස් බෝතල් තොගයක් |
| 19. | 74404 | හිස් බියර් ටින් පොහොර උර 01යි |

08. චින්තා පැදුරු

| | | |
|---|---|---|
| 01. | 74473 | 02 |

09. හිස් බැරල්

| | | |
|---|---|---|
| 01. | 74517 | 01 |
| 02. | 74321 | 01 |
| 03. | 73804 | 01 |
| 04. | 73793 | 01 |
| 05. | 75087 | 01 |
| 06. | 73148 | 01 |
| 07. | 73277 | 01 |
| 08. | 73309 | 01 |
| 09. | 73377 | 01 |
| 10. | 74845 | 01 |
| 11. | 73901 | 01 |
| 12. | 72830 | 01 |
| 13. | 71239 | 02 |

10. උසාවි ගොඩනැගිලි අලුත්වැඩියා කිරීමේ දී සහ නව ගොඩනැගිලි ඉදි කිරීමේ දී ඉවත් කරන ලද පහත සඳහන් ද්‍රව්‍ය,

01. දිරාපත් වෙමින් පවතින යකඩ ගේට්ටු පියන් 04
02. දිරාපත් වූ අබලි යකඩ රාක්ක කැබලි තොගයක්
03. දිරාපත් වෙමින් පවතින පරාල හා යට ලී තොගයක්
04. අබලන් වූ දොර පියන් කැබලි තොගයක්
05. දිරාපත්වූ ලේඛනාගාර යකඩ රාක්ක කැබලි තොගයක්
06. පාවිච්චියෙන් ඉවත් කරන ලද අඩි හතරේ විදුලි ලාම්පු ආවරණ තොගයක්
07. අබලන්වූ සීලිම් විදුලි පංකා 07යි.

06-622

---

**මහෙස්ත්‍රාත් අධිකරණය - නුවරඑළිය**

අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ නඩු භාණ්ඩ හා කාර්යාලයේ පාවිච්චියෙන් පසු ඉවත් කරන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

නුවරඑළිය මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරනු ලැබූ සහ මෙතෙක් හිමිකම් නොකියන ලද හා හඳුනාගත නොහැකි භාණ්ඩ සහ නුවරඑළිය මහෙස්ත්‍රාත් අධිකරණ කාර්යාලයේ භාවිතයෙන් පසු ඉවත් කරන ලද ඉහත සඳහන් භාණ්ඩ 2013.07.20 වැනි දින පෙ. ව. 10.00 ට නුවරඑළිය මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත සඳහන් භාණ්ඩ පිළිබඳව හිමිකම් දක්වන්නෙකු වේ නම්, වෙන්දේසිය පවත්වන දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු ය.

03. අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබාගෙන වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2 කට පෙර වෙන්දේසි කිරීමට නියමිත භාණ්ඩ මහජනතාවට පරීක්ෂා කළ හැකි ය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන ලංසුව පිළිනොගන්නා අවස්ථාවක දී අධිකරණයේ අභිමතය පරිදි එකී භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතු ය.

05. වෙන්දේසියෙන් භාණ්ඩ මිල දී ගනු ලබන අයට ජාතික හැඳුනුම්පත තිබිය යුතු අතර, මුදලින් පමණක් ගෙවීම් කළ යුතු ය.

06. වෙන්දේසියේ දී මිළ දී ගන්නා ලද භාණ්ඩ සඳහා එවෙලේ ම මුදල් ගෙවිය යුතු අතර, ප. ව. 3.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

ඒ. ඩී. සී. එස්. හේවාවසම්,
මහෙස්ත්‍රාත් අධිකරණය,
නුවරඑළිය.

2013 ජූනි මස 10 වැනි දින,
නුවරඑළිය මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**භාණ්ඩ ලැයිස්තුව**

| *අනු. අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ විස්තරය* | *ප්‍රමාණය* |
|---|---|---|---|
| 01. | 38154 | ගෑස් සිලින්ඩර් | 01 |
| 02. | අංක රහිත | කුෂන් සහිත පුටු සෙට් | 01 |
| 03. | අංක රහිත | කුෂන් රහිත පුටු සෙට් | 01 |
| 04. | අංක රහිත | පැට්‍රල් මැක්ස් | 02 |
| 05. | අංක රහිත | පිහි | තොගයක් |
| 06. | අංක රහිත | සවල් | 05 |
| 07. | අංක රහිත | පොරෝ | 02 |
| 08. | අංක රහිත | තැලුණු ඇලුමිනියම් මුට්ටි | 04 |
| 09. | අංක රහිත | බෝතල් අසුරන ප්ලාස්ටික් පෙට්ටි | 10 |
| 10. | අංක රහිත | තට්ටු තරාදි | තොගයක් |
| 11. | අංක රහිත | තෙල් මනින කරඩි | 05 |
| 12. | 87400 | ගෑස් සිලින්ඩර් | 01 |

**2013 භාණ්ඩ සමීක්ෂණයේ දී වෙන්දේසි කිරීමට නිර්දේශිත භාණ්ඩ**

| | | | |
|---|---|---|---|
| 01. | ලාච්චු 04 සහිත ලී කබඩ් | (පිටු අංක 29) | 07 |
| 02. | වානේ අල්මාරි | (පිටු අංක 29) | 01 |
| 03. | ලී අල්මාරි | (පිටු අංක 68) | 02 |
| 04. | විශාල දැල්පොත් රාක්ක | (පිටු අංක 68) | 02 |
| 05. | පොත් රාක්ක අඩි 5 x 4 x 3 | (පිටු අංක 46) | 01 |
| 06. | විත්ති කූඩු | (පිටු අංක 31) | 01 |
| 07. | බංකු (ඇඳි රහිත) | (පිටු අංක 45) | 05 |
| 08. | හන්ටර් වර්ගයේ පා පැදි | (පිටු අංක 62) | 01 |
| 09. | ස්ටේප්ලර් යන්ත්‍ර | (පිටු අංක 61) | 18 |
| 10. | අංක KBLF/05/0414 පරිගණක කී බෝඩ් | (පිටු අංක 55) | 01 |

06-792

---

# රජයේ නොවන දැන්වීම්

**දැන්වීමයි**

බිලැක්පූල් හන්දිය, නුවරඑළිය පදිංචි, කනංකෙ විතානගේ මුනිදාස වන මා මෙහි ප්‍රකාශ කර සිටින වග නම්, ප්‍රසිද්ධ නොතාරිස් උචිත එස්. බණ්ඩාර මගින් සැබෑ බවට සාක්ෂි දරන, අංක 171, උඩකනම්පැල්ල, පූගොඩ පදිංචි, වර්ණකුලසූරිය ආරච්චිගේ දොන් රොහාන් සුජිත් ප්‍රියදර්ශනට දෙනු ලැබූ අංක 117 සහ 2012.01.05 දින දරන විශේෂ ඇටර්නි බලය 2012.09.20 දින සිට බල පැවැත්වෙන පරිදි අවලංගු කරනු ලැබූ බවයි.

කේ. වී. මුනිදාස.

06-582

**ප්‍රසිද්ධ නිවේදනය**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.

සමාගමේ නම : නිකෝබා ඔන්ලයින් කාර් ෂෝරූම් (ප්‍රයිවට් ලිමිටඩ්)
සමාගමේ අංකය : පී වී 92376
සංස්ථාගත කළ දිනය : 2013.05.06
ලියාපදිංචි කාර්යාල ලිපිනය : අංක 76, මාකොළ දකුණ, මාකොළ.

සමාගම් අධ්‍යක්ෂ.

06-627

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීමේ දැන්වීම

මාකොළ දකුණ, ජයමාවත, අංක 6/7 දරන ස්ථානයේ පදිංචි ජයසිංහ ආරච්චිලාගේ අයෝමි කුෂලා ජයසිංහ (ජාතික හැඳුනුම්පත් අංක 748343580 V හිමි) යන මා විසින් ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ඕ. හෙට්ටිආරච්චි 2007.03.28 වැනි දින හෙයියන්තුඩුවේ දී ලියා සහතික කළ අංක 1028 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් මාකොළ, මාකොළ දකුණ, ජයමාවත, අංක 6/7, දරන ස්ථානයේ පදිංචි මහලියනගේ දෝන මෙරායා එලියබෙත් (ජාතික හැඳුනුම්පත් අංක 466233617 V හිමි) යන අය වෙත බලය පවරන ලද ඇටෝර්නි බලපත්‍රය අවලංගු කළ බව ශ්‍රී ලංකා ජනරජයටත්, මහජනතාවටත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

ජයසිංහ ආරච්චිලාගේ අයෝමි කුෂලා ජයසිංහ,
ඇටෝර්නි අධිපති.

06-701

---

### නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : මොනාර්ච් කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 92743
සංස්ථාගත කළ දිනය : 2013.05.28
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 109, සිරි ධම්ම මාවත, කොළඹ 10.

විදාන ගමගේ කරුණාසේන,
සමාගම් ලේකම්.

අංක 12/3, නෙලුම් මාවත,
පිට හරමානිස් පාර, අත්තිඩිය,
දෙහිවල.

06-693

---

### සීමිත වගකීම් සහිත සමාගමක් සංස්ථාපනය කිරීම පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර මෙසේ නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : ක්‍රික් සිලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී. වී. 92329
සංස්ථාගත කිරීමේ දිනය : 2013 මැයි 20
සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 9/1, කර්නල් ටී. ජී. ජයවර්ධන මාවත, කොළඹ 03.

පී. ඩබ්. කෝපරේට් සෙක්‍රටේරියල් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගමේ ලේකම්.

06-692

### 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : ඇටෙක්නියා සස්ටේනබල් ඩිවලොප්මන්ට්ස් හෝල්ඩිං (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 92859
දිනය : 2013.06.04
ලියාපදිංචි ලිපිනය : අංක 172, උසාවිය පාර, කොළඹ 12
සමාගමේ ලේකම් : සී මැතිව් සහ කො. (පුද්ගලික) සමාගම.
එස්. ඊ. සී./(2) 2013/311

06-674

---

### නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් ලියාපදිංචි කිරීමේ පනතේ 09 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් ආයතන සංස්ථාපිත කළ බවට කෙරෙන දැනුම් දීමයි.

ආයතනයේ නම : උර්බනිස්මා ඉන්ටර්නැෂනල් (පුද්ගලික) සමාගම
ආයතන අංකය : පී වී 92664
ලියාපදිංචි කාර්යාලය : අංක 50/2බී, රැම්පර්ට් ටෙරස්, රැම්පර්ට් පාර, ඇතුල්කෝට්ටේ
සංස්ථාපිත කළ දිනය : 2013 මැයි 22.

ආයතන ලේකම්වරුන්.

06-671

---

### නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : බුක්මාර්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 92505
ලිපිනය : අංක 651/25, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට, කොළඹ
සංස්ථාගත කළ දිනය : 2013.05.14

සමාගම් ලේකම්.

06-641

---

### සමාගමේ නාමය වෙනස් කිරීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය යටතේ නාමය වෙනස් කිරීම පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනයයි.

සමාගමේ පෙර පැවති නාමය : සී. පී. ලොජිස්ටික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 71937
සමාගමේ ලියාපදිංචි ලිපිනය : අංක 17, දෙවැනි මහල, ඩිල් පෙදෙස, කොළඹ 03
සමාගමේ නව නාමය : කාගෝ -පාට්නර් ලොජිස්ටික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

කාගෝ - පාට්නර් ලොජිස්ටික්ස් වෙනුවෙන්

ජේසී ඇන්ඩ් කම්පැනි,
සමාගම් ලේකම්වරු.

06-632

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බවට කරනු ලබන දැන්වීමයි.

සමාගමේ නම : පී. එස්. ඉංජිනියරින් සර්විසස් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී. වී. 84079
ලියාපදිංචි ලිපිනය : අංක 9/45, 3 වැනි පටුමඟ, වුඩ්ලන්ඩ් ඇවනිව්, කොහුවල, නුගේගොඩ
සංස්ථාගත කළ දිනය : 2012.02.02

ගෙස්ට්මන් කෝපොරේට් කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

06-800

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බවට කරනු ලබන දැන්වීමයි.

සමාගමේ නම : මහාමේඝ පබ්ලිෂර්ස්
ලියාපදිංචි අංකය : ජී. ඒ. 2623
ලියාපදිංචි ලිපිනය : මහාමේඝ බෞද්ධ ආරාමය, වඩුවාව, යටිගල්ඔලුව, පොල්ගහවෙල
සංස්ථාගත කළ දිනය : 2011.10.11

ගෙස්ට්මන් කෝපරේට් කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

අංක 371/2, 1/1,
මීගමු පාර, වැලිසර.

06-799

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බවට කරනු ලබන දැන්වීමයි.

සමාගමේ නම : සොලුසිස් කන්සල්ටිං (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී. වී. 86149
ලියාපදිංචි ලිපිනය : අංක 9/45, 3 වැනි පටුමඟ, වුඩ්ලන්ඩ් ඇවනිව්, කොහුවල, නුගේගොඩ.
සංස්ථාගත කළ දිනය : 2012.06.01.

ගෙස්ට්මන් කෝපරේට් කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

06-798

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය යටතේ සංස්ථාගත කිරීම පිළිබඳව ප්‍රසිද්ධ දැන්වීමයි.

සමාගමේ පෙර නම : ක්‍රීඩන්ස් හෙල්ත් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අලුත් නම : ක්‍රීඩන්ස් ජෙනෝමික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ නම වෙනස් වූ දිනය : 2013.06.04
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 78459
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 3/1, රාජකීය මාවත, කොළඹ 07

සරවනන් නීලකන්ඩන්,
අධ්‍යක්ෂක.
එම් ඇන්ඩ් එන් ඒජන්ට්ස් ඇන්ඩ් සෙක්‍රටරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
(සමාගමේ ලේකම්වරු),

එම්. ඇන්ඩ් එන්. ගොඩනැගිල්ල,
(5 වන තලය),
අංක 2, ඩීල් පෙදෙස,
කොළඹ 03.

06-752

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 9 (1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : විශ්ව කලර් ග්‍රැෆික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි ලිපිනය : 559 C 1/1, ගාලු පාර, පානදුර
ලියාපදිංචි අංකය : පී වී 92291
ලියාපදිංචි දිනය : 2013.04.30

කී මැනේජ්මන්ට් කන්සල්ටන්ස් (පුද්.) සමාගම,
සමාගම් ලේකම්වරු.

06-745/1

## සමාගමේ නම වෙනස් කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 9 (2) වගන්තිය යටතේ පහත සඳහන් සමාගමේ නම 2013 අප්‍රේල් මස 24 වැනි දින සිට වෙනස් කර ඇත.

සමාගමේ පැරණි නම : ට්විස්ට් ඉට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අලුත් නම : රොමාක් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 85722
ලියාපදිංචි ලිපිනය : අංක 398/3, ගැඩබුවාන අලුත් පාර, පිළියන්දල

කී මැනේජ්මන්ට් කන්සල්ටන්ස් (පුද්ගලික) සමාගම,
සමාගම් ලේකම්වරු.

06-745/2

## ප්‍රසිද්ධ නිවේදනය

පහත සඳහන් සීමිත වගකීම් සහිත සමාගම 2013 මැයි මස 10 වැනි දින සංස්ථාපනය කරන ලද බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියට අනුගාමීව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : සිලෝන් ජැපෑන් සෙකියුරිටීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 92476
ලියාපදිංචි කාර්යාලය : ලෙවල් 06, නැගෙනහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, එච්ලන් චතුරශ්‍රය, කොළඹ 1

සමාගම් ලේකම්.

06-756

## මහජනතාව වෙත දැනුම්දීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සීමාසහිත පුද්ගලික සමාගම 2013 අප්‍රේල් මස 23 වැනිදා ස්ථාපිත කළබව මෙයින් දන්වා සිටිනු ලැබේ.

සමාගමේ නම : ස්පෙෂලිස්ට් නෝලේජ් සෙන්ටර් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී වී 92073
ලියාපදිංචි ලිපිනය : අංක 20, බෝධිරාජ මාවත, ජයන්තිපුර, බත්තරමුල්ල.

සමාගම් ලේකම්.

06-744

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ශ්‍රී ලංකාවාසී සියලු දෙනාගේ ම දැනගැනීම පිණිස හෙළිදරව් කර සිටින වග නම්, අම්බලන්ගොඩ, හෙප්පුමුල්ල, ආර්. ඊ. ද සිල්වා මාවත, අංක 37/1ඒ හි පදිංචි රුවන්පුර කල්‍යානි හරිස්චන්ද්‍ර ද සිල්වා වන මම, අම්බලන්ගොඩ හෙප්පුමුල්ල, ආර්. ඊ. ද සිල්වා මාවත, අංක 37/1ඒ හි පදිංචි, රුවන්පුර සුසන්ත හරිස්චන්ද්‍ර වෙත ලබාදී ඇති 2011.06.29 වැනි දින ග්ලෝරියා එස් සච්දොච් සයිප්‍රස් නිකෝසියාහි නීති නිලධාරී විසින් ලියා සහතික කළ ඇටෝර්නි බලපත්‍රය, ඇටෝර්නි බලපත්‍ර පොතේ 30 කාණ්ඩයේ 31 පත් ඉරුවේ 1621 දින පොත් අංක යටතේ ලියාපදිංචි වී ඇති බවත්, එකී ඇටෝර්නි බලපත්‍රය මෙයින් අවලංගු කරන බව දැනුම් දෙමි. එම නිසා මින් ඉදිරියට ඉහත කී රුවන්පුර සුසන්ත හරිස්චන්ද්‍ර විසින් මා වෙනුවෙන් සහ මාගේ නමින් කරන කිසිදු ක්‍රියාවකට වග නොකියන බව මෙයින් දැනුම් දෙමි.

රුවන්පුර කල්‍යානි හරිස්චන්ද්‍ර ද සිල්වා,

2013 ජුනි මස 09 වැනි දින,
අංක 37/1ඒ, ආර්. ඊ. ද සිල්වා මාවත,
හෙප්පුමුල්ල,
අම්බලන්ගොඩ.

06-814

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ කොන්දේසි ප්‍රකාරව නිව් නයිල් ප්‍රඩක්ස් පුද්ගලික සමාගම 2009 දෙසැම්බර් මස 22 වැනි දින සංස්ථාපනය කරන ලදී.

ස. ලි. ප. අ. : පී වී 70456
ලියාපදිංචි කාර්යාලය : අංක බී/105, අවිස්සාවේල්ල පාර, ගලිගමුව.

එස්. කේ. චමින්ද සෙනෙවිරත්න,
ලියාපදිංචි කළ ලේකම්.

06-809

## වගකීමෙන් සීමිත සමාගමක් සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කිරීම පිළිබඳ අප විසින් මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : සමර් සීසන් රෙසිඩන්සීස් එල්ටීඩී
සමාගමේ අංකය : පී බී 5123
ලියාපදිංචි කළ දිනය : 2013.06.10
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : ලෙවල් 27, බටහිර කුළුණ, ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය, ඉචෙලන් චතුරශ්‍රය, කොළඹ 01.

සමර් සීසන් රෙසිඩන්සීස් එල්ටීඩී සඳහා සහ වෙනුවෙන්

පී ඩබ්ලිව් කෝපරේට් සෙක්‍රටේරියල් (පීවීටී) එල්ටීඩී,
සමාගම් ලේකම්වරුන්.

2013 ජුනි මස 14 වැනි දින.

06-807

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

කොටහේන, ශ්‍රී ගුණානන්ද මාවත, අංක 115/26ඒ යන ලිපිනයේ පදිංචි, දසනායක මහ මුදියන්සේලාගේ නිර්මලා වන මම කොටහේන, ශ්‍රී ගුණානන්ද මාවත, අංක 115/26 ඒ යන ලිපිනයේ පදිංචි, දසනායක මහ මුදියන්සේලාගේ නාලනී යන අයට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ප්‍රදීපා චන්දිමා මහකුමාරගේ මහත්මිය විසින් ලියා සහතික කළ අංක 479 හා 2001.12.01 දින දරන ඇටර්නි බලපත්‍රය මගින් මා වෙනුවෙන් ක්‍රියා කිරීමට දී තිබූ ඇටර්නි බලය අද දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරන අතර එදිනට පසු ඇය විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවකට මා විසින් වග නොකියන බවත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

දසනායක මහ මුදියන්සේලාගේ නිර්මලා.

2013 ජුනි මස 14 වැනි දින.

06-823

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව මෙයින් දන්වමු.

| *ලියාපදිංචි සමාගමේ නම* | *ලියාපදිංචි අංකය* | *ලියාපදිංචි කළ දිනය* | *ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය* |
|---|---|---|---|
| 1. විස්කි පොයින්ට් සර්ෆ් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 92841 | 2013.06.03 | අංක 129/1, ශ්‍රී සරණංකර පාර, දෙහිවල |
| 2. පේපර් මූන් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 92919 | 2013.06.06 | අංක 129/1, ශ්‍රී සරණංකර පාර, දෙහිවල |
| 3. ඉකෝ ෆ්‍රෙන්ඩ්ලි වුඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 92867 | 2013.06.05 | අංක 10/1, ලිලියන් මාවත, ගල්කිස්ස. |

ෆයිනෑන්ෂියල් ඇන්ඩ් බිස්නස් ඇසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

දුරකථන අංකය : 7452060-1

06-824

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී**

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන වෙන්දේසියයි

**කොළඹ ඩාර්ලි පාරේ වරිපනම් අංක 421/59 දරන පරිශ්‍රය තුළ පිහිටි පර්චස් 15ක් විශාලැති අගනා දේපළක්**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා පරිපාලන සීමාව තුළ කොට්ඨාස අංක 24 (සුදුවැල්ල) පිහිටි ඩාර්ලි පාරේ පෙර වරිපනම් අංක 421/60 සහ දැන් වරිපනම් අංක 421/59 (ටී. බී. ජයා මාවත) දරන ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. ආර්. ඩයස් අබේගුණවර්ධන විසින් 2002 අප්‍රේල් මස 2 වැනි දින මැන සාදන ලද අංක 4066 දරන කෝන්ගහවත්ත නමැති ඉඩමේ සීමා නිර්ණය කර බෙදා වෙන් කර ඇති කැබලි අංක 2 දරන ඉඩම් කොටස සහ මෙම දේපළෙහි දැනට තබා ඇති හා මින් මතු කලින් කල තැබිය හැකි හෝ ස්ථිරවම සවිකර හැකි සෑම සහ සියලු චංචල යන්ත්‍රෝපකරණ, සවිකිරීම් සහ ඇමුණුම් ඇතුලු විදුලිය සැපයීමේ ජලය සැපයීමේ පද්ධති හා පණිවුඩ හුවමාරු උපකරණ සහ වෙනත් චංචල යන්ත්‍ර/ යන්ත්‍රෝපකරණ ඇතුලුව 2008 නොවැම්බර් මස 4 වැනි දින ලියා සහතික කරන ලද අංක 752 දරන බැදුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ලියාපදිංචි කරන ලද ගහළවත්ත තේ කම්හල නමින් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන කොළඹ 05 පදිංචි මීරා සහීබ් මොහමඩ් රොසායිස් සහ අලීෆා මොහමඩ් රොසායිස් යන අය විසින් පැහැර ඇති හෙයින් ඉහත කී බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත වර්ෂ 2013ක් වූ ජූලි මස 19 වැනි දින පෙ. ව. 10.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩිදුර විස්තර සඳහා 2013.05.31 වැනි දින ශ්‍රී ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය ද, 2013.05.17 වැනි දින "ද අයිලන්ඩ්" "දිවයින" සහ " තිනකරන්" යන පුවත්පත් බලන්න.

*දේපළට ප්‍රවිශ්ඨ වන මාර්ගය.* - කොළඹ මහනගර මංසන්දියේ සිට යුනියන් පෙදෙස (ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවතේ හයිඩ් පාර්ක් මංසන්දිය දක්වා ගමන් කර දකුණට හැරී ටී බී ජයා මාවතේ මීටර් 300ක් පමණ ගමන් කර විනයාලංකාර මාවතේ පසුකර මීටර් 75ක් පමණ ගමන් කර එක්සෙල් වර්ල්ඩ් ඉදිරිපිට පිහිටි අඩි 10-12ක් පමණ වන පාරට හැරී මීටර් 35ක් පමණ ගමන් කර නැවත කොන්ක්‍රීට් අතුරා සකස් කර ඇති අඩි 12ක් පමණ පළලැති පාරේ මීටර් 50ක් පමණ ගමන් කිරීමෙන් මෙම දේපළට පිවිසිය හැකි ය.

වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවේලේ ම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතුයි. (1) ගැණුම් මුදලින් 10%ක් ද, (2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද සහ වැට් බද්ද, (3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2%ක් ද, (4) සියලුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද, (5) ලිපිකරු සහ සෝෂක ගාස්තු වශයෙන් රු. 1,500 ක් ද, (6) විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු වශයෙන් රු. 3,000ක් ද වේ. ගැණුම් මිලේ ඉතිරි 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගෙවා අවසන් කළ යුතුයි.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් සියලුම ලියකියවිලි හා විස්තර ලබා ගැනීම සඳහා කොළඹ 02 නවම් මාවතේ අංක 40 දරන ස්ථානයේ පිහිටි නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී හි නීති කළමනාකරු අයකිරීම් ගෙන් විමසන්න. දුරකථන අංක 2448448, 011-7448448.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස් තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු.

අංක 134, බැද්දගාන පාර,
කෝට්ටේ
දුරකථන අංක : 2873656, 0777-672082 ෆැක්ස් අංකය : 2871184.

06-749

**සෙලාන් බැංකුව පීඑල්සී - නුගේගොඩ ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ විකිණීමයි

මෙම දේපළ හේවා කටුවාදෙනියගේ ජානක යන අය බන්ධනදායි වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ , මහරගම ප්‍රාදේශිය සභා සීමාව තුළ පන්නිපිටිය ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. ජී. ඉන්දුලාල් සොයිසා විසින් සාදන ලද 1997.09.08 දිනැති අංක 189/97 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ඇරැව්වල පාර වරිපනම් අංක 20 දරන දෙල්ගහවත්ත නමැති ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් 1 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 189/97 දරන සැලැස්ම අනුව පර්චස් දහසයයි දශම හතයි අටක් (අ. 0, රූ. 0, පර්. 16.78) විශාල ඉඩම.

පහත සඳහන් ඉඩම තුළ උඩින් සහ දිගේ මාර්ග අයිතිය සහ එයට අදාළ වෙනත් පොදු අයිතීන් සමග.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම සුළු නගර සභා සීමාව තුළ වෝඩ් අංක 8 පන්නිපිටිය පිහිටි බලයලත් මිනින්දෝරු ටී. ඒ. බූරා විසින් සාදන ලද 1967.02.18 දිනැති අංක 397 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දෙල්ගහවත්ත නමැති ඉඩමේ ලොට් 5 ලකුණු කළ (අඩි 10ක් පළල පාර සඳහා වෙන් කිරීම) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 397 දරන සැලැස්ම අනුව පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) විශාල ඉඩම.

ඉහත සඳහන් දේපළ 2013 ජූලි මස 16 වැනි දින පෙරවරු 11.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - හයිලෙවල් පාරේ මහරගම මංසන්ධියේ සිට කි. මී. 1.6 ක් පමණ ගිය විට පිහිටි රොසලින් අක්කගෙ කඩේ හංදිය අසලින් දකුණු පසට ඇති ඇරැව්වල පාරට හැරී තවත් මීටර් 250 ක් පමණ ගොස් නැවතත් දකුණු පසට ඇති අඩි 15 ක් පමණ පළල ඇති පාරට හැරී තවත් මීටර් 50 ක් පමණ ඉදිරියට ගිය විට අදාළ දේපළ පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම.* - *රජයේ ගැසට් පත්‍රයේ* 2009.12.18 වැනි දින පළ වී ඇති අතර ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2009.11.21 වැනි දින ද තිනකුරල් පුවත්පතේ 2009.12.18 වැනි දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක්. 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500, 6. සියලුම ප්‍රචාරක වියදම් ද, ගැණුම් මිලෙන් ඉතිරි 90% ද විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිමකළ යුතු ය.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. ප්‍රධාන කළමනාකාරිණිය (නීති), සෙලාන් බැංකුව, පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක 011- 2456482, 2456487.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව.
දුරකථන අංක : 011-3068185, 011-2572940.

06-754

---

**සම්පත් බැංකුව - පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි

එම්. ඩබ්ලිව්. එම්. පී. එන්. බී. කුලතුංග
ගිණුම් අංක : 0040 5900 0549

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2009 පෙබරවාරි මස 26 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් එක්කෝටි පන් ලක්ෂ හතලිස් දහස් හත්සිය හැට හතරයි ශත දහ හතරක (රු. 10,540,764.14) මුදල ද, 2008 දෙසැම්බර් මස 31 වැනි දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් අනු තුන් ලක්ෂ හැට පන්දහස් හතයි ශත අසූපහක (රු. 9,365,007.85) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ තුනයි දශම දෙකයි පහක් (13.25%) බැගින් වූ පොලිය ද, හා ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වේතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2010.07.16 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* 2010.07.07 වැනි දින "දිවයින" "අයිලන්ඩ්" සහ "තිනකුරල්" දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2013.07.17 වැනි දින පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන ෂොක්මන් සහ සමරවික්‍රම යන අය විසින් , ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරලේ පල්ලේ පත්තුවේ කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ හෝකන්දර පිහිටි "වෙලන්ගිරිය එස්ටේට්" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක

තැන අයි. ටී. මාදොළ යන අය විසින් සාදන ලද 2003 පෙබරවාරි මස 02 දාතම හා අංක 2003/44 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 67 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 73 සහ 70 නැගෙනහිරට : ලොට් 70, 66 සහ 64 දකුණට : ලොට් 66, 64 සහ 63 සහ බස්නාහිරට : ලොට් 63 සහ 73 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයක් (අ. 0 රූ. 0 පර්. 10) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 2003/44 දරන පිඹුරට අනුව වෙලුම/පත්‍රිරුව G 1601/26 යටතේ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

පහත සඳහන් දැ මතින් හා ඒ දිගේ ගමන් කිරීමේ මාර්ග අයිතිය ද සමගය.

අංක 2003/44 දරන එකී පිඹුරේ නිරූපිත ලොට් 70 (අඩි 20 පළල පාර සඳහා වෙන්කිරීම)

අංක 2003/44 දරන එකී පිඹුරේ නිරූපිත ලොට් 49 (අඩි 20 පළල පාර සඳහා වෙන්කිරීම)

අංක 2003/44 දරන එකී පිඹුරේ නිරූපිත ලොට් 62 (අඩි 20 පළල පාර සඳහා වෙන්කිරීම)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

06-803

---

නඩු අංකය : 18928 පී.

**කොළඹ දිසා අධිකරණයේ දී ය**

රාජගිරිය, රාජගිරිය පාර, අංක 224 හි නිලෙන්ති කොන්ඩ්‍රට් ෆෙඩ්රික් ද සිල්වා කරුණාසිරි

........................*පැමිණිලිකරු.*

-එදිරිව-

ංකය :
ජී

01. රාජගිරිය, රාජගිරිය පාර, අංක 228 හි කලුබෝවිලගේ රෙජිනෝල්ඩ් රත්නසිරි පෙරේරා

..........................*01 වන විත්තිකරු.*

02. කලුබෝවිලගේ පියර්සන් පත්මසිරි පෙරේරා

......................*01 ඒ විත්තිකරු*

සහ

අධිකරණයට අපහාස කිරීම සම්බන්ධයෙන් සිවිල් නඩු විධාන සංග්‍රහයේ L X V පරිච්ජේදය යටතේ වූ කාරණාව ගැනයි.

රාජගිරිය රාජගිරිය පාර අංක 224 හි නිලෙන්ති ෆෙඩ්රික් ද සිල්වා කරුණාසිරි.

..................*පැමිණිලිකාර පෙත්සම්කරු*

කලුබෝවිලගේ පියර්සන් පත්මසිරි පෙරේරා

....................*01 ඒ විත්තිකරු.*

කුඩා ඉඩමක් සහ අඩක් නිම කළ නිවසක්

වර්ෂ 2013ක් වූ ජූලි මස 23 වැනි දින පෙ. ව. 10.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ පිළිබඳ විස්තර.-* බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරලේ පල්ලේ පත්තුවේ කෝට්ටේ මහ නගර සභා සීමාව තුළ රාජගිරියේ වැලිකඩ පිහිටි කහටගහවත්ත නම් ඉඩම බලයලත් මිනින්දෝරු ඒ. එෆ්. සමීර් මානක තැන විසින් 1979.10.22 දින මැන සාදන ලද අංක 2224 දරන පිඹුර ප්‍රකාර කැබලි අංක 3 හෙවත් රාජගිරිය පාරේ වරිපනම් අංක 228 දරන බිම් කොටස බලයලත් මිනින්දෝරු කේ. පී. විජේවීර විසින් නැවත මැන සාදන ලද අංක 1879 හා 2001.05.01 දින දරන පිඹුර ප්‍රකාර එකී කෝට්ටේ මහ නගර සභා සීමාව තුළ වැලිකඩ ගමේ රාජගිරිය පාරේ වරිපනම් අංක 228 දරන කහටගහවත්ත නමැති ඉඩම අංක 2224 පිඹුරේ දැක්වෙන බිම් කොටස් 3 නැවත මැන කොටස් අංක ඒ වශයෙන් ලකුණුකර දැක්වෙන කොටස් 1 කින් යුත් ඉඩම් කොටස.

ප්‍රමාණය : අ. 0 රූ. 0 පර්. 2.75.

*දේපළට පිවිසීම.* - රාජගිරිය නගරයේ සිට රාජගිරිය පාරේ කි. මී. 1/4ක් පමණ ගමන් කළ පසු තුන් මංහන්දියක් හමුවේ. එම තුන් මංහන්දියෙන් වම්පසට ඇති රාජගිරිය පාරේ තවත් මී. 50ක් පමණ ගිය පසු පාරේ දකුණු පස විකිණීමට නියමිත මෙම දේපළ පිහිටා ඇත.

වැඩි විස්තර සඳහා 2013.06.28 වැනි දින දරන රජයේ *ගැසට් පත්‍රය* සහ 2013.06.22 දින දිනමිණ, ඩේලි මිරර් සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් මුදල් ගැණුම්කරු විසින් වෙන්දේසිකරුට එවේලේ ම මුදලින් ගෙවිය යුතු ය.

01. ගැණුම් මිලෙන් 25%ක් ද,
02. වෙන්දේසිකරුගේ ගාස්තුව වශයෙන් 2 1/2%ක් ද,
03. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව වශයෙන් රුපියල් 1,000 ක් ද,
04. නොතාරිස් ගාස්තුව රුපියල් හය දහස් පන්සියයක් (රු. 6,500) ක් ද,
05. වෙන්දේසියේ ප්‍රචාරක වියදම් සහ වෙනත් ගාස්තු ඇතොත් ඒවා ද,
06. වෙන්දේසි මුදලින් ඉතිරි මුදල වන 75% ක මුදල වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත දී කොළඹ දිසා අධිකරණයේ ඉහත අංකය දරන නඩුවේ බැරට තැන්පත් කළ යුතු ය.

ශ්‍රියානී මනම්පේරි,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු
සහ බලයලත් වෙන්දේසිකරු.

දුරකථන අංක : 0713-151356, 0717582473.

අංක 09, බෙල්මන්ට් වීදිය,
කොළඹ 12.

06-825

### ගොඩනැගිලි සහිත ඉඩමක් වෙන්දේසියේ විකිණීම

කොළඹ දිසා අධිකරණයේ දී ය

ඒෂියා ඇසට් ෆිනෑන්ස් ලිමිටඩ්,
(මීර පෙර ෆිනෑන්ස් ඇන්ඩ් ලෑන්ඩ් සේල්ස් ලිමිටඩ් නමින් හඳුන්වනු ලැබූ) අංක 36,
ඩඩ්ලි සේනානායක මාවත, කොළඹ 08.

නඩු අංකයඃ
17849/එම්. බී.

.........................පැමිණිලිකරු.

එදිරිව

රාජපක්ෂ රන්කිර පතිරණගේ මාරියන් රොෂානි පෙරේරා,
ආර්. එන්ටර්ප්‍රයිසස්, අංක 38, හේකිත්ත හරස් පාර,
හැඳල, වත්තල.

.......................විත්තිකරු.

කොළඹ දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති විකිණීමේ අධිකාරී පත්‍රයට අනුව ඉහත විත්තිකරුගෙන් පැමිණිලිකරුට අයකර ගැනීමට ඇති රු. 2,334,239 ක මුදලක් ද, එකී මුදල මත 2007.01.30 දින සිට තීන්දු ප්‍රකාශයේ දින දක්වා ද, ඉන්පසු තීන්දු ප්‍රකාශයේ සඳහන් මුළු මුදල මත එම මුදල ගෙවා නිම කරන තුරු වර්ෂයකට 22%ක් බැගින් වූ අනුප්‍රමාණයකට පොළිය ද, මසකට 4.5% ක් බැගින් වූ දඩ පොළියක් ද, ගෙවීම සඳහා ද නියෝග කර එම මුදල් අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ විස්තර වන ප්‍රමාණයෙන් අක්කර 46 රූ. 1 පර්චස් 31ක් විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන ලෙසට මා වෙත නියෝග කර ඇති බැවින් මාතලේ දඹුල්ල පාරේ නාඋල, කරවිලහේන පාර, නොහොත් උඩ හාදුව ගමේ දේපළ පිහිටි ස්ථානයේ දී 2013 ජූලි මස 24 වැනි දින පස්වරු 1.00 ට ම විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බවට මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

*දේපළට පිවිසෙන මාර්ගය.-* මාතලේ දඹුල්ල මාර්ගයේ දඹුල්ල දෙසට යන විට නාඋල නගරය පසුකර කෙටි දුරක් ගොස් දකුණට ඇති කරවිලහේන පාර නොහොත් හාදුව පාරේ කි. මී. 3ක් පමණ ගොස් හාදුව උප තැපැල් කාර්යාලය පසුකර ටික දුරක් යන විට දකුණට ඇති බොරළු පාරේ මීටර් 500ක් පමණ ගිය තැන දකුණට එම මාර්ගයට ම මුහුණලා මෙම දේපළ පිහිටා තිබේ.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් මුදල් සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිකරු වන මා වෙත ගෙවිය යුතු ය. සියලුම ගෙවීම් මුදලින් හෝ බැංකු අණකරයකින් පමණක් කළ යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

01. මුළු ගැණුම් මිලෙන් සියයට විසිපහක (25%) මුදලක්. ඉතිරි සියයට හැත්තෑපහක (75%) මුදල වෙන්දේසි දින සිට දින තිහක් (30) ඇතුළත කොළඹ දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත් කළ යුතු ය.

02. වෙන්දේසිය ප්‍රසිද්ධියට පත් කිරීමේ ගැසට් නිවේදනය, පුවත්පත් දැන්වීම් ආදී වෙන්දේසිය ප්‍රසිද්ධියට පත් කිරීමේ වියදම් ද, විකිණීමේ කොන්දේසි සහතික කිරීමේ නීතිඥ ගාස්තු ඇතුළු සියලුම ප්‍රචාරක වියදම් ද,

03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල සියයට දෙකහමාරක් (2 1/2%)

04. නාඋල ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු මුළු ගැණුම් මුදලෙන් 1% ක වෙළඳ බද්ද,

05. ලිපිකරු හා සෝෂක ගාස්තු.

මෙම දේපළ රු. 16,838,900 කට තක්සේරු කර ඇත. වෙන්දේසියේ දී ලංසු තබා ඉල්ලීමට බලාපොරොත්තු වන ගැණුම්කරුවන් ඉහත 25% ක මුදල සඳහා අවම වශයෙන් රු. 4,200,000 ක බැංකු අණකරයක් කොළඹ දිසා අධිකරණයේ රෙජිස්ට්‍රාර් නමින් ලියා වෙන්දේසි දින වෙන්දේසිය ආරම්භ කිරීමට ප්‍රථමයෙන් මා වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ කරන අයට පමණක් වෙන්දේසියේ දී ලංසු තැබීමට ඉඩදෙනු ලැබේ.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ උතුරු වගපනහ උඩසිය පත්තුවේ නාඋල ප්‍රාදේශීය සභා සීමාව තුළ උඩ හාදුව පිහිටි වලව්වේ හාදුව ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. රාජසේකරන් විසින් මැන සකස් කරන ලද අංක 5338 සහ 2001.03.31 දින දරන පිඹුරේ සඳහන් කැබලි අංක 1 දරන දේපළට මායිම් උතුරට ඃ නාඋල සිට හඳුවල දක්වා යන පාර ද, නැගෙනහිරට ඃ ඇලක් සඳහා වෙන් කරන ලද කොටස සහ කරුණාරත්නට අයත් ඉඩම ද, දකුණට ඃ ඇලක් සඳහා වෙන් කළ කොටස ද, බස්නාහිරට ඃ එම ඉඩමේ ඉතිරි කොටස ද යන මායිම් තුළ පිහිටි අක්කර හතයි රූඩ් තුනයි පර්චස් විසි එකක් (අ. 7 රූ. 3 පර්. 21) විශාල ඉඩම සහ ඊට අයිති වැවිලි සහ සෑම සියලු දේත් වේ. මෙම ඉඩම මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙලුම පත්ඉරු ඩී. 452/83 හි ලියාපදිංචි කර ඇත.

මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ උතුරු වගපනහ උඩසිය පත්තුවේ නාඋල ප්‍රාදේශීය සභා සීමාව තුළ උඩ හාදුව පිහිටි වලව්වේ හාදුව ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. රාජසේකරන් විසින් මැන සකස් කරන ලද අංක 5338 සහ 2001.03.31 දින දරන පිඹුරේ සඳහන් කැබලි අංක 2 දරන දේපළට මායිම්, උතුරට ඃ ඇලක් සඳහා වෙන් කළ කොටස ද, නැගෙනහිරට ඃ ඇලක් සඳහා වෙන් කළ කොටස ද, දකුණටඃ ඇලක් සඳහා වෙන් කළ කොටස ද, බස්නාහිරට ඃ පල්ලේ හාදුව ගම ද යන මායිම් තුළ පිහිටි අක්කර තිස් අටයි පර්චස් හතරක් (අ. 38 රූ. 0 පර්. 4) විශාල ඉඩම සහ ඊට අයිති වැවිලි සහ සෑම සියලු දේත් වේ. මෙම ඉඩම මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙලුම පත්ඉරු ඩී. 452/84 හි ලියාපදිංචි කර ඇත.

මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ උතුරු වගපනහ උඩසිය පත්තුවේ නාඋල ප්‍රාදේශීය සභා සීමාව තුළ උඩ හාදුව පිහිටි වලව්වේ හාදුව ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. රාජසේකරන් විසින් මැන සකස් කරන ලද අංක 5338 සහ 2001.03.31 වැනි දින දරන පිඹුරේ

සඳහන් කැබලි අංක 3 දරන දේපළට මායිම් උතුරට ඃ ඇලක් සඳහා වෙන් කළ කොටස ද, නැගෙනහිරට සහ දකුණට ඃ ඇල ද, බස්නාහිරට ඃ පල්ලේ හාදුව ගම ද යන මායිම් තුළ පිහිටි රූඩ් දෙකයි පර්චස් හය (අ. 0 රූ. 2 පර්. 6) විශාල ඉඩම සහ ඊට අයිති වැවිලි සහ සියලු දේත් වේ. මෙම ඉඩම මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම පත්ඉරු ඩී. 452/85 හි ලියාපදිංචි කර ඇත.

*වැඩි විස්තර විමසීමට .-* ජ්‍යෙෂ්ඨ ණය අයකිරීමේ නිලධාරි, ඒෂියා ඇසට් ෆිනෑන්ස් ලිමිටඩ්.

දුරකථන අංකය ඃ 0777 322409.

එන්. ජේ. එදිරිසිංහ,
මුළු දිවයිනටම සාම විනිසුරු,
උසාවි කොමසාරිස්, වෙන්දේසිකරු හා තක්සේරුකරු.

2013 ජූනි මස 12 වැනි දින දී ය,
244, පරණ කොට්ටාව පාර,
ඇඹුල්දෙනිය,
නුගේගොඩ.

දුරකථන අංකය ඃ 0777453463.

06-759

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.